# හදිසි මරණ පරීක්ෂණයක් පවත්වන්නේ කෙසේද?

මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු

අතීතයේ සිටම සෑම සමාජයකම හදිසි මරණ හා අස්වාභාවික හේතු මත සිදුවන මරණ පිළිබඳව පරීක්ෂා කිරීමේ ක්‍රමයක් පැවතුනි. සිංහල රජ දවස පවා මරණ පරීක්ෂණ සඳහා රජු විසින් ලේකම්වරු, කෝරලේවරු සහ විදානේවරු පත්කරනු ලැබූ බව ඉතිහාසගතව ඇත. එම පරීක්ෂණ ක්‍රියාවලිය "සාක්කි බැලීම" ලෙස හඳුන්වා ඇත. කිසියම් දේහයක් සොයාගත් විට "සාක්කි බැලීමේ" කාර්යය නිමවන තුරු කිසිවෙකු දේහය ස්පර්ශ නොකළ යුතු බව එදා පැවති රාජ නියෝගයය.

එංගලන්තයේ පැවති "කොරනර් ක්‍රමය" 1796න් පසුව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීහුය.

"කොරනර්" නැතිනම් හදිසි මරණ පරීක්ෂක තනතුර ඉතා සම්භාවනීය වූත්, ඉතා වගකීමකින් යුක්ත වූත්, තනතුරකි. හදිසියේ සිදුවන මරණ පිළිබඳව කඩිනම් එහෙත් පරිපූර්ණ, සාධාරණ, අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා අධිකරණයට ආධාර දීමත්, හැකි ඉක්මනින් අවසන් කටයුතු සඳහා දේහය ඥාතීන්ට භාරදීමත් හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ ප්‍රධාන කාර්යයයි.


## පරීක්ෂණ සිදු කළ යුතු මරණ

### සිය දිවි නසා ගැනීම්

කෙනෙකුගේ මරණයක් සිදුව ඇත්තේ සිය දිවි නසා ගැනීමක් ලෙස සැක කරන්නේ නම් අදාළ මරණය පිළිබඳව මරණ පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යාවශ්‍යය.

සිය දිවි නසා ගැනීම සඳහා භාවිත කළ ක්‍රමය සොයා බැලීමත්, එවැනි මරණ වැළැක්වීම සඳහා බලධාරීන්ට කළ යුතු යමක් ඇත්නම් ඒ පිළිබඳව අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමත් හදිසි මරණ පරීක්ෂකවරයාට පැවරෙන රාජකාරියය. උදාහරණයක් ලෙස යම් කිසි කෘෂි රසායනිකයක් පළාතේ සිය දිවි නසා ගැනීම් රැසකට හේතුකාරක වී ඇත්නම් ඒ පිළිබඳව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා දැනුවත් කිරීම ඔහුට කළ හැකිය.

### සතෙකු විසින් සිදු කරන මරණ



සතෙකු විසින් සිදු කරන මරණ

අලි-ඇතුන්, ගවයන්, වළසුන් ආදී සතුන් විසින් මෙන්ම සර්ප දෂ්ඨන නිසා සිදු වන මරණ ද හදිසි මරණ පරීක්ෂකවරයාගේ පරීක්ෂණයට ලක් කළ යුතුය. වයිරසයක් මගින් පැතිරෙන රෝගයක් වුව ද සතෙකු සපා කෑමෙන් සිදු වන ජලභීතිකාව ද මරණ පරීක්ෂණයට ලක් කළ යුතුය.

### යන්ත්‍රෝපකරණ නිසා සිදුවන මරණ

නිවස තුළදී හෝ කර්මාන්තශාලාවක දී හෝ යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා මරණයක් සිදු වුවහොත් එය ද හදිසි මරණ පරීක්ෂණයට ලක් කළ යුතුය.

කර්මාන්තශාලාවක සිදුවන මරණයකදී කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂකවරයෙකු ද මරණය සිදුවූ ස්ථානයට ගොස් පරීක්ෂකවරයාට සහාය ලබා දිය යුතුය. මෙහිදී මරණ පරීක්ෂකවරයා ලබා දෙන වාර්තාව උසාවියකදී විභාග වන නඩුවක සාක්ෂියක් ලෙස මෙන්ම වන්දි ලබා ගැනීමේ අවශ්‍යතාවයකදී ඒ සඳහා ද උපකාරී වෙයි.

නිවෙස තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ විදුලි උපකරණ භාවිතය නිසා හෝ හදිසි අනතුරු සිදුවිය හැකිය. මෙවැනි අවස්ථාවලදී මරණ පරීක්ෂකවරයා ඉතා සුපරීක්ෂාකාරී ලෙස අදාළ පරීක්ෂණ පවත්වා මරණයට හේතුව සිදුවූ ආකාරය, වළක්වා ගැනීමට ගත යුතුව තිබූ පියවර ද සිය වාර්තා පොතක තම පරීක්ෂණ සමග සටහන් කිරීම අවශ්‍යය.

## අහඹු අනතුරකින් සිදු වන මරණ

හදිසි අනතුරු විවිධ තේමා යටතේ ගොනු කළ හැකිය. ඒ,

- මහාමාර්ගවල සිදු වන අනතුරු
- දුම්රිය අනතුරු
- ගුවන් අනතුරු
- බෝට්ටු හා නැව් අනතුරු
- දියේ ගිලීමෙන් සිදු වන අනතුරු
- ලිස්සා වැටීමෙන්, උසකින් වැටීමේ හෝ ගෙදර දොර හා වත්තේදී සිදු වන අනතුරු ආදී වශයෙනි.

මෙම මරණ සිද්ධීන් හා සම්බන්ධව මරණ පරීක්ෂකවරයා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මිය ගිය අයට වන්දි ලබා ගැනීමට, රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට මෙන්ම නොසැලකිලිමත් ලෙස ක්‍රියා කරමින් අනතුර සිදු කිරීමට මුල් වූ අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මරණ පරීක්ෂකවරයාගේ වාර්තාව උපකාරී වෙයි.

## හදිසියේ සිදු වන මරණ

කිසිදු රෝග ලක්ෂණයක් බාහිර වශයෙන් නොපෙන්වා හෝ රෝග ලක්ෂණ මතුවී පැය 24ක් ඇතුළත හෝ සිදු වන මරණ, හදිසි මරණ ලෙස සැලකෙන (උදාඃ හදිසි හෘදයාබාධයක්, ආඝාත තත්වයක් හේතුකොට ඇතිවන මරණ) අතර, අදාළ මරණය පිළිබඳව පැහැදිලි ස්වාභාවික හේතුවක් එම රෝගියාට ප්‍රතිකාර කළ වෛද්‍යවරයාට ලබා දිය නොහැකිනම් එවැනි මරණ සඳහා ද හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

## නොදන්නා හේතුවකින් සිදුවන මරණ



ගුවන් අනතුරක්

හදිසි මරණ ලෙස සැලකිය නොහැකි වුවත්, ප්‍රතිකාර කරන වෛද්‍යවරයාට හේතුව නිගමනය කළ නොහැකි නම් උදාඃ උදර වේදනාවක් සඳහා දින 3ක් රෝහල් ගත කළ රෝගියෙකුගේ රෝගයට හේතුව කායික පරීක්ෂණවලින් හෙළිදරව් කර ගත නොහැකිව තිබියදී මරණයට පත් වුවහොත් එම මරණය සඳහා ද හදිසි මරණ පරීක්ෂණයක් සිදු කළ යුතුවේ.

ශල්‍යකර්මයකින් පසුව සිදුවන මරණ සඳහාද මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය. සමහර විට මෙවැනි මරණ සඳහා උසාවියේදී හෝ පශ්චාත් මරණ පරීක්ෂණවල හෝ හදිසි මරණ පරීක්ෂකවරයාගේ වාර්තාව ප්‍රයෝජනවත් වීමට ඉඩ ඇත.

## අපරාධයක් නිසා සිදු වූ මරණයක් හෙවත් මිනීමැරුමක්


මරණ පරීක්ෂකවරයෙකුගේ වාර්තාවකින් හෝ ඔහු ඉදිරියේ ඉදිරිපත් වූ වෙනත් තොරතුරු හේතුවෙන් හෝ අපරාධයක් සිදුව ඇති බවට සාධාරණ සැකයක් ඇති වුවහොත් මහේස්ත්‍රාත්වරයකු හෝ අධිකරණ ඇමතිවරයා විසින් බලය පවරන මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් මරණ පරීක්ෂණයක් සිදු කළ යුතුය.

## මානසික රෝහලක හෝ ලාදුරු රෝහලක හෝ සිදුවන මරණ

මානසික රෝහල්වලදී සේවකයන් හෝ අනෙක් රෝගීන් හෝ විසින් පහර දී මිය යෑම හෝ සේවකයන්ගේ නොසැලකිල්ල නිසා හෝ මරණ සිදු විය හැකි බැවින් මෙම ආයතනවල සිදු වන මරණ පිළිබඳව ද මරණ පරීක්ෂණ සිදු කළ යුතුය.

## පොලිසිය භාරයේ හෝ බන්ධනාගාරයක සිදු වන මරණ

මෙවැනි ස්ථානවල සිටින අයගේ මරණයක් සිදු වූ විට එය ස්වාභාවික හේතු නිසා සිදු වුවද එවැනි ආයතනයකදී මෙම මරණය සිදු වූයේ නිලධාරීන්ගේ නොසැලකිල්ල හෝ පහරදීම හෝ නිසා යැයි සැක කළ හැකි හදිසි මරණ පරීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය වෙයි.



යන්ත්‍රෝපකරණ නිසා සිදුවන මරණ

මරණ පරීක්ෂණයක් පවත්වන හදිසි මරණ පරීක්ෂකවරයාගේ

කාර්ය අපරාධයක් හෝ වරදක් විභාග කිරීම නොවේ. පරීක්ෂණය පවත්වන්නේ මරණයට හේතුව හා එය සිදුවූ ආකාරය සොයා ගැනීමටය.

## පශ්චාත් මරණ පරීක්ෂණ

මරණ පරීක්ෂණයකදී වෛද්‍යවරයෙකු ලවා පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුද නැත්ද යන්න තීරණය කරන්නේ හදිසි මරණ පරීක්ෂකවරයාය. පසුව අධිකරණයේ විභාගයක් සිදු විය හැකි මිනී මැරුමක් හෝ රිය අනතුරක් නිසා හෝ සිදු වූ මරණයක් නම් ඒ සඳහා පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය. සිය දිවි හානි කර ගැනීමක දී පශ්චාත් මරණ පරීක්ෂණයක් අත්‍යවශ්‍ය නොවුවද පසුව එවැනි මරණයක් ගැන සැක ඇති වේ යැයි අදහසක් පළ වුවහොත් ඒ සඳහා පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍යය. එලෙසින් උස ගොඩනැගිල්ලකින්, ගසකින් වැටීම, විෂවීම් හේතු කොට, කර්මාන්ත ශාලාවක සේවය කරන විට ආදී වශයෙන් සිදු වන මරණ ආදියේදී ද සැකයක් ඇත්නම් හදිසි මරණ පරීක්ෂකවරයාගේ අභිමතය පරිදි පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගත හැකිය.

සමහර පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වන්නේ අධ්‍යාපනික හා පර්යේෂණ අවශ්‍යතා සඳහාය. රෝගී තත්වය නිර්ණයට, රෝගය සිරුර තුළ ව්‍යාප්ත වූ ආකාරය සොයා ගැනීමට, එයට රෝගී තත්වය බලපෑ ආකාරය, ඉන්ද්‍රියවල තත්වය විමසීමට සිදු කෙරෙන මෙම පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා බලය දීමට හදිසි මරණ පරීක්ෂකවරයාට නොහැකිය.

**රෝගී තත්වය නිර්ණයට, රෝගය සිරුර තුළ ව්‍යාප්ත වූ ආකාරය සොයා ගැනීමට, එයට රෝගී තත්වය බලපෑ ආකාරය, ඉන්ද්‍රියවල තත්වය විමසීමට සිදු කෙරෙන මෙම පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා බලය දීමට හදිසි මරණ පරීක්ෂකවරයාට නොහැකිය.**

ඒ සඳහා මිය ගිය අයගේ ඥාතීන්ගේ අවසරය ලිඛිතව ලද යුතුය.

විදේශිකයෙකු ලංකාවේ මිය ගිය හොත් ඔහුගේ රටේ තානාපති කාර්යාලයට ඒ බව දන්වා ඔවුන්ගේ නියෝජිතයෙකු හදිසි මරණ පරීක්ෂණයකට සහභාගි කර ගත හැකිය. නොහඳුනන මෘත ශරීරයක් නම් මරණයට පත් තැනැත්තා හඳුනා ගැනීමට අවශ්‍ය ඡායාරූප, ඇඟිලි සලකුණු ලබා ගැනීම ආදී දෑ සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දීමට හදිසි මරණ පරීක්ෂකවරයාට පුළුවන.

**මරණ පරීක්ෂණයක් පවත්වන ස්ථානය අධිකරණ උසාවියක් ලෙස සැලකෙන හෙයින් පොලිසිය මගින් එම ස්ථානය අධිකරණයක ගෞරවය ආරක්ෂා වන පරිදි සකස් කළ යුතුය. එහි කාර්යයන්ට බාධා කරන ඕනෑම අයෙකුව අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට පොසිසියට බලය ඇත.**

## හදිසි මරණ පරීක්ෂණයේ අවසාන ප්‍රතිඵලය

- මිය ගිය තැනැත්තා කවුද?
- මරණය සිදු වූ වේලාව හා දිනය කුමක්ද?
- මරණයට හේතුව කුමක්ද?
- මරණය සිදුවූයේ කෙසේද? (ස්වාභාවික හේතුවක්, මිනී මැරුමක්, රිය අනතුරක් ආදී වශයෙන්)

යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමක් හදිසි මරණ පරීක්ෂණයකදී සිදු වෙයි.

වෛද්‍යවරු, පොලිසිය, ග්‍රාමසේවා නිලධාරීන් හෝ ඥාතීන් විසින් හදිසි මරණය සිදුවූ බව මරණ පරීක්ෂකවරයාට දන්වූ පසු හදිසි මරණ පරීක්ෂකවරයා මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස් පරීක්ෂණ පැවැත්විය යුතුය. අදාළ කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී හා පොලිසිය එහි සිටිය යුතු අතර මරණය පිළිබඳව ඇති සියළු සාක්ෂි එත්තනදී ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

මරණ පරීක්ෂණයක් පවත්වන ස්ථානය අධිකරණ උසාවියක් ලෙස සැලකෙන හෙයින් පොලිසිය මගින් එම ස්ථානය අධිකරණයක ගෞරවය ආරක්ෂා වන පරිදි සකස් කළ යුතුය. එහි කාර්යයන්ට බාධා කරන ඕනෑම අයෙකුව අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිසියට බලය ඇත. මාධ්‍යවේදීන්ට මෙම පරීක්ෂණයට සහභාගි වී එය වාර්තා කිරීමට අවසර දීමද කළ හැකිය.
පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වූයේ නම්, එම පරීක්ෂණය කළ වෛද්‍යවරයා විසින් මරණයට හේතුව අනිවාර්යයෙන්ම වාර්තා කරයි. එය මරණය පිළිබඳ තම සොයා ගැනීම ප්‍රකාශ කිරීමට හදිසි මරණ පරීක්ෂකවරයාට පහසු කරවයි. එසේ නැතහොත් පොලිසිය හා ඥාතීන් ඉදිරිපත් කළ සාක්ෂි, වෛද්‍ය සාක්ෂි මත සිය සොයාගැනීම ප්‍රකාශ කර දේහය ඥාතීන්ට භාර දීමට ඔහු උපදෙස් ලබා දෙයි. මරණ පරීක්ෂකවරයෙකුට පරීක්ෂණ පැවැත්විය හැක්කේ සිය බල ප්‍රදේශය තුළ පමණය. ඉන් පිටත කොට්ඨාශයක පරීක්ෂණයක් කිරීමට නම් අදාළ කොට්ඨාශයේ පරීක්ෂකවරයාගේ ලිඛිත ඉල්ලීමක් හෝ මහේස්ත්‍රාත්තුමාගේ නියෝගයක් හෝ අවශ්‍යය.

කොළඹ විශ්වවිද්‍යාලයේ
වෛද්‍ය පීඨයේ අධිකරණ වෛද්‍ය හා විෂවේදය පිළිබඳ අධ්‍යයන අංශයේ
**මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු**
(M.BBS, MD, FCCP, FCGP, FRCP (Lond.); FRCP (Glasgow), FRCP (Edin), FRC Path (UK), DMJ (Lond.)